# ආර්.එස්. හෙට්ටිආරච්චි එ. දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, මාතර (සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, දෙවිනුවර)

RTIC Appeal (ලේඛනගත කාර්යය පටිපාටිය)/ 237/2021 (2021.06.29 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී. ජී. එම්. වී. හපුආරච්චි

**අභියාචක** - ආර්.එස්. හෙට්ටිආරච්චි
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරී, මාතර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය

## පෙනීසිටීම

මෙය ලේඛනගත කාර්යපටිපාටිය හරහා විභාග කරන ලදී.

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2020.08.12 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | පිළිතුරක් නැත |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2020.08.30 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | පිළිතුරක් නැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2020.10.13 (email පණිවිඩයක් මගින්) |

**අභියාචනයට පසුබිම් වූ කරුණු**:

අභියාචක විසින් 2020.08.12 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. *ඔබ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල බල ප්‍රදේශයේ 2020.ජුලි 17 සිට අගෝස්තු 02 දක්වා කාලය තුලදී පැවැත්වූ මැතිවරණ ප්‍රචාරක රැලි පැවැත්වීම සදහා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ මගින් කොපමන දැනුවත්කිරීම් ප්‍රමානයක් කර තිබේද?*
2. *ඔබ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල බල ප්‍රදේශයේ 2020.ජුලි 17 සිට අගෝස්තු 02 දක්වා කාලය තුලදී පැවැත්වූ මැතිවරණ ප්‍රචාරක රැලි පැවැත්වීම සදහා සමඟි ජනබලවේගය මගින් කොපමන දැනුවත්කිරීම් ප්‍රමානයක් කර තිබේද?*
3. *ඔබ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල බල ප්‍රදේශයේ 2020.ජුලි 17 සිට අගෝස්තු 02 දක්වා කාලය තුලදී පැවැත්වූ මැතිවරණ ප්‍රචාරක රැලි පැවැත්වීම සදහා එක්සත් ජාතික පක්ෂය මගින් කොපමන දැනුවත්කිරීම් ප්‍රමානයක් කර තිබේද?*
4. *ප්රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල බල ප්‍රදේශයේ 2020.ජුලි 17 සිට අගෝස්තු 02 දක්වා කාලය තුලදී පැවැත්වූ මැතිවරණ ප්‍රචාරක රැලි පැවැත්වීම සදහා ජාතික ජනබලවේගය මගින් කොපමන දැනුවත්කිරීම් ප්‍රමානයක් කර තිබේද?*
5. *ඔබ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල බල ප්‍රදේශයේ 2020.ජුලි 17 සිට අගෝස්තු 02 දක්වා කාලය තුලදී පැවැත්වූ මැතිවරණ ප්‍රචාරක රැලි පැවැත්වීම සදහා ඉහත පක්ෂ හැර වෙනත් පක්ෂ මගින් කොපමන දැනුවත්කිරීම් ප්‍රමානයක් කර තිබේද?*

*(2020.07.17 දින නිරෝධායන සහ රෝග වැලක්වීමේ ආඥාපනතේ 2 සහ 3 වගන්ති යටතේ සැකසූ අංක 2184/34 යටතේ අතිවිශේෂ ගැසට් පත්‍රයට අදාලව)*

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2020.08.30 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයාද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2020.10.13 දිනැතිව email පණිවිඩයක් මගින් කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

## අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:

රට තුළ COVID-19 වසංගතය හේතුවෙන් පවත්නා හදිසි සෞඛ්‍ය තත්වය හේතු කොට ගෙන පවතින තත්ත්වය සැලකිල්ලට ගෙන 2021.05.18 වන දින විභාගයට නියමිත අභියාචනා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවේ අභියාචනා දින දර්ශනය ප්‍රතිසංවිධානය කිරීම හේතුවෙන් 2021.06.29 දින විභාගයට ගන්නා ලදී.

මෙම අභියාචනය සඳහා, ගොනුවේ ඇති ලේඛන මත පදනම්ව කොමිෂන් සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව පහත නියෝගයන් නිකුත් කරනු ලැබේ.

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, දෙවිනුවර විසින් 2020.12.15 දිනැති ලිපිය මගින් *"...රාහුල් සමන්ත හෙට්ටිආරච්චි මහතා විසින් තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඔබ වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාව මගින් ඉල්ලා ඇති තොරතුරු ඒ මහතා වෙත යොමු කර ඇති අතර එහි පිටපතක් (2020.12.14 දිනැති ලිපිය) මේ සමග ඔබ වෙත ඉදිරිපත් කරමි"* යන්නෙන් කොමිෂන් සභාව දැනුවත් කර ඇත .

දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, මාතර තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් තම ස්ථාවරය 2021.05.04 දිනැති ලිපිය මගින් කොමිෂන් සභාව දැනුවත් කර ඇති බව නිරීක්ෂණය කරන ලදී.

අභියාචක 2021.05.27 දිනැති ලිපිය (email පණිවිඩයක් මගින්) මගින් මෙසේ දැනුවත් කර ඇත;

*"<u>තොරතුරු දැනගැනීමේ පනතට අනුව ඉල්ලා සිටි තොරතුරු ලබා දුන් බව දැනුම් දීම සඳහා</u>*

*...... මා විසින් 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 3(1) වගන්තියට ප්‍රකාරව පහත සඳහන් පොදු අධිකාරීන් මගින් ඉල්ලා සිටි තොරතුරු, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචානා කිරීමෙන් අනතුරුව අදාළ පොදු අධිකාරීන් මගින් එම තොරතුරු ලබාදී ඇති බව දන්වා සිටිමි. එමෙන් පහත පොදු අධිකාරීන් සඳහා එම කාරනා සම්බන්ධයෙන් තවදුරටත් අභියාචනා විභාගයක් පැවැත්වීමට අවශ්‍ය නොමැති බවද කාරුණිකව දන්වා සිටිමි*

1. *මාතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - ( RTIC Appeal / 230 /2021 )*

2. *මාතර මුලටියන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - (RTIC Appeal / 229 /2021 )*

3. *මාතර තිහගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - (RTIC Appeal / 233 /2021 )*

4. ***මාතර දෙවිනුවර සෞඛ්‍ය cවෛද්‍ය නිලධාරී කාර්යාලය - (RTIC Appeal / 237 /2021 )***

5. *මාතර පස්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - (RTIC Appeal / 234 /2021 )*

6. *මාතර හක්මණ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - (RTIC Appeal / 236 /2021 )*

7. *පේරාදෙණිය ශික්ෂණ රෝහල - (RTIC Appeal / 232 /2021)"*

**නියෝගය:**

මෙහිදී කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටිනුයේ තොරතුරු ඉල්ලීම සම්බන්ධව ප්‍රතිචාර දැක්වීමට තොරතුරු නිලධාරියා හා නම්කල නිලධාරියා කටයුතු කර නොමැති බවයි. ඒ අනුව තොරතුරු දැනගැනීමේ පනතේ 24(3) වගන්තියේ සඳහන් පරිදි "ඉල්ලීමක් ලැබීමේදී එම ඉල්ලීම ඉදිරිපත් කළ පුරවැසියා වෙත තොරතුරු නිලධරයෙකු විසින් වහාම එම ඉල්ලීම ලැබීම පිළිබඳ ලිඛිත දැනුම්දීමක් යොමුකරනු ලැබිය යුතුය" යන්න හ 25 (1) වගන්තියේ සඳහන් පරිදි "තොරතුරු නිලධරයෙකු විසින්, හැකි ඉක්මණින් සහ කෙසේ වූවද 24 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ලබී දින 14 ක් ඇතුළත...... ඉල්ලා සිටින ලද තොරතුරු සැපයීමට හෝ මේ පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති හේතුවලින් යම් එක් හේතුවක් හෝ ඊට වඩි ගණනක් මත එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හෝ තීරණය කළ යුතු අතර එම තීරණය ඉල්ලීම කල පුරවැසියා හට වහාම සන්නිවේදනය කළ යුතුය" යන සිය ව්‍යවස්ථාපිත වගකීම සිදුකර නොමැති බවයි.

එසේම නම්කළ නිලධාරියාද පනතේ 31(2) වගන්තිය අනුව එනම් " නම්කළ නිලධරයා විසින් ඕනෑම අවස්ථාවකදී එසේ වූවත් වැඩකරන දින තුනක කාලයක් ඇතුළත අභියාචනය කරනු ලබන පුරවැසියා වෙත එම අභියාචනය භාර ගැනීමේ දී කුවිතාන්සියක් නිකුත් කළ යුතුය" හා 31(3**)** වගන්තියේ සඳහන් පරිදි "නම්කළ නිලධාරියා විසින් (1) වන උප වගන්තිය යටතේ සඳහන් කර ඇති යම් අභියාචනයක්

පිළිබඳ තීරණය එම අභියාචනය ලැබී සති තුනක කාලයක් ඇතුළත ලබාදිය යුතු අතර ඒ සඳහා නිශ්චිත පදනම ඇතුළුව එම තීරණය සඳහා වූ හේතු දැක්විය යුතුය" යන සිය ව්‍යවස්ථාපිත වගකීම ඉටුකර නොමැති බව නිරීක්ෂණය කර සිටී. ඉහත සදහන් තත්වයන් යටතේ, ඉදිරියේදී තොරතුරු දැන ගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීමේදී පනතේ දක්වා ඇති ව්‍යවස්ථාපිත කාල නියමයන් අනුගමනය කරන ලෙසට පොදු අධිකාරියට නියම කරනු ලැබේ.

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමාගේ, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, දෙවිනුවර 2020.12.15 දිනැති ලිපිය සහ අභියාචකගේ 2021.05.27 දිනැති ලිපිය අනුව පොදු අධිකාරිය සන්තකයේ, භාරයේ හෝ පාලනයේ ඇති මෙම තොරතුරු ඉල්ලීමට අදාළ තොරතුරු අභියාචකට ලැබී ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබේ. ඒ අනුව, තොරතුරු පනතෙහි 3 වන වගන්තියේ ඇති අවශ්‍යතා සපුරාලන බැවින් අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.